www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සදාම් හුසේන් මරන දඬුවමට ලක් කිරීම

## The execution of Saddam Hussein

**කර්තෘ මන්ඩලය විසිනි**
**2006 දෙසැම්බර් 30**

ඉරාකයේ හිටපු ජනාධිපති සදාම් හුසේන් මරන දඬුවමට ලක් කිරීම යුක්තිය ඉටු කිරීමක් නොවේ. එය වනාහි බුෂ් පාලනාධිකාරයේ හා එහි ඉරාක රූකඩයන්ගේ දේශපාලන අරමුනු සාක්ෂාත් වීම යි. කඩිමුඩියේ, රහසිගතව, සනාන්ධකාර රාත්‍රියේ, නෛතික ක්‍රියාදාමයන් මුලුමනින් ම සමච්චලයට ලක් කරමින් මරන දඬුවම ක්‍රියාවට දැමූ ආකාරයෙන් අවධාරනය වන්නේ ඉරාකයේ සමස්ත ඇමරිකානු ව්‍යාපෘතියේ ම නීති විරෝධී, ප්‍රතිගාමී ස්වභාවය පමනි.

දෙසැම්බර් 26 දා ඉරාක ආන්ඩුවේ අධිකරනයක් මගින් තහවුරු කරන ලද හුසේන්ට එරෙහි මරන දඬුවම් තීන්දුව ක්‍රියාවට දමන්නේ කෙසේ ද කුමන කොන්දේසි යටතේ ද යන්න සම්බන්ධයෙන් සිකුරාදා (දෙසැම්බර් 29) දවස පුරාම පැවතියේ එකිනෙකට පටහැනි ප්‍රකාශයන් ය. අධිකරන ක්‍රියාදාමයන් නාමිකව පාලනය කල අගමැති නොවුරි අල්-මලිකි ආන්ඩුව ද සිරකරුවා අත් අඩංගුවේ තබා ගෙන සිට එක්සත් ජනපද පාලනය යටතේ පවතින හරිත කලාපය තුල පිහිටි වධකාගාරයට ඔහුව භාර දුන් ඇමරිකානු මිලිටරි අධිකාරීන් ද අතර දිගට ම පනිවිඩ හුවමාරු විය.

හුසේන් එල්ලුම් ගසට යැවීම අධිකරනමය තීන්දුවක් නොවේ. එය දේශපාලන තීන්දුවකි. නොවැම්බර් 5 දා විශේෂ අධිකරනයක් මගින් මරන දඬුවම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව අල්-මලිකි විසින් ම එම කාරනාව සනිටුහන් කලේ, නව වසර උදාවීමට පෙර හුසේන් මරන දඬුවමට ලක් කරන බව ප්‍රකාශ කිරීමෙනි. එම කාල නියමයට අනුව දඬුවම ක්‍රියාවට දැමීම ඉක්මන් කරනු පිනිස, ඉරාක නිලධාරිහු අධිකරනමය සාධාරනත්වය සහ තමන්ගේ ම ව්‍යවස්ථාව යන අති මූලික මූලධර්ම දෙක ම නොතකා ක්‍රියා කලහ. ඉරාක ව්‍යවස්ථාවට අනුව මරන දඬුවම් තීන්දුවක් වත්මන් ඉරාක ජනාධිපති ජලාල් තලබානි විසින් තහවුරු කල යුතු ය.

හ්‍යුමන් රයිට්ස් වොච් සංවිධානයේ ජාත්‍යන්තර යුක්තිය පිලිබඳ අධ්‍යක්ෂ රිචඩ් ඩිකර් සිකුරාදා ගාර්ඩියන් සඟරාවට ලියූ තීරු ලිපියක පැහැදිලි කර තිබූ පරිදි, නෛතික විධි පිලිවෙල විකාරයක් විය.

ඔහු මෙසේ සඳහන් කලේ යඃ "නොවැම්බර් 5 දා තීන්දුව හා දඬුවම ප්‍රකාශයට පත් කරන විට . . . නඩුව විනිශ්චය . . . අවසන් කර නොතිබුනි. විත්තියේ නීතිඥයන් අතට නඩු වාර්තාව ලැබුනේ නොවැම්බර් 22 දා ය. අධිකරනයේ ව්‍යවස්ථාවට අනුව, විත්තියේ නීතිඥයන් දෙසැම්බර් 5 දා සිය අභියාචනා ගොනු කල යුතු විය. එනම් පිටු 300කින් යුක්ත නඩු තීන්දුවට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට ලැබුනේ සති දෙකකටත් අඩු කාලයකි. ඉරාක නීතිය මගින් ඉඩ සලසා ඇති පරිදි ඉදිරිපත් කර ඇති නෛතික තර්ක සලකා බලනු පිනිස අභියාචනා අධිකරනය කිසිදාක නඩු විමසීමක් පවත්වා නැත. සති තුනකට අඩු කලක දී විත්තියේ ලිඛිත දේශන සමග පිටු 300ක නඩු තීන්දුව සාධාරනව සමාලෝචනය කොට අදාල සියලු කරුනු සලකා බැලීමට අභියාචනා අධිකරනයට හැකි වූ බව විශ්වාස කල නොහැකි ය."

මෙහි පැවතුනේ, හුසේන්ට ලැබුනාට වඩා පුලුල් ආකාරයෙන් නිසි අධිකරනමය ක්‍රියාදාමයක් පිලිබඳ අයිතීන් ජීවත්ව සිටි නාසි නායකයන්ට ලබා දුන් නියුරෙම්බර්ග් අධිකරනය ආදර්ශ කොට ගත් උසාවියක් නොවේ. ඊට පටහැනිව, රූකඩ විනිසුරෙකු, කල් තබා නිර්නය කල නඩු තීන්දුවක් සහ රාත්‍රී සනාන්ධකාරයේ ක්‍රියාවට දැමූ දඬුවමක් සහිත බැග්ඩෑඩ්හි නඩු විභාගය මතකට නැංවූයේ ස්ටැලින්වාදී හෝ නාසි බොරු නඩු විභාගයකි.

### දේශපාලන අරමුනු

බුෂ් පාලනාධිකාරයේ අති මූලිකම දේශපාලන අරමුන වන්නේ, විවෘතව, ලෝකයාගේ ඇස් ඉදිරි පිට, සිය ප්‍රධාන විරුද්ධවාදියකු මරා දැමීමේ ආශාව ක්‍රියාත්මක කිරීමට තමන්ට ඇති පුලුවන්කම හා අධිෂ්ඨානය ප්‍රදර්ශනය කිරීම යි. ධවල මන්දිරය දකින පරිදි, සදාම්ට අත් කල ඉරනම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මොන යම් හෝ අනාගත විරුද්ධවාදියෙකුට හොඳ පාඩමකිඃ වොෂිංටනයේ කැමැත්තට එරෙහිව ක්‍රියා කරනු, එවිට ඔහුගේ ලේ වැකි ඉරනම ඔබට ද අත් විය හැකි ය.

දිනපතා සිදු වන ඉරාක හා ඇමරිකානු ජීවිත හානි සංඛ්‍යාව පිලිබඳ භයංකර දර්ශනයෙන් ඇස් ඉවතට හැරවීම සඳහා ඉරාකය තුල එක්සත් ජනපදය

සාර්ථකත්වයක් ලබන බව ඔප්පු කිරීමේ සාක්ෂ්‍යයක් ලෙස කියා පෑ හැකි සිද්ධියක් මෙම මරන දඬුවමෙන් බුෂ් පාලනාධිකාරයට ලබා දෙයි. මරන දඬුවම පිලිබඳ මාධ්‍ය ප්‍රචාරය විසින් එක්සත් ජනපද සොල්දාදුවන්ගේ මරන සංඛ්‍යාව පිලිබඳ වාර්තා බෙහෙවින් ඉක්මවනු ලැබ ඇත. යුද්ධයෙන් මිය ගිය එක්සත් ජනපද සොල්දාදුවන්ගේ සංඛ්‍යාව දෙසැම්බර් මාසය තුල 100 මට්ටමට නැංග අතර එය මාසය අවසන් වීමට පෙර සමස්තයක් ලෙස 3000ට වඩා ඉහල යාමට ඉඩ තිබේ.

මෙම රාජ්‍ය ඝාතනයේ එක් අභිප්‍රායක් වන්නේ වඩ වඩා මහජන වෛරයට හා අස්ථාවර භාවයට පාත්‍රව වටලනු ලැබ ඇති අල්-මලිකිගේ පාලන තන්ත්‍රයට අඩු ගනනේ කෙටි කාලීන දේශපාලන මුක්කුවක් ලබා දීම යි. ඔහුගේ ප්‍රධාන දේශපාලන සගයකු වන රැඩිකල් ෂියා මුස්ලිම් පූජකයකු වන මොක්ටාඩා අල්-සදර්ගෙන් භේද වී ඔහුට හිතවත් ෂියා සන්නද්ධ කන්ඩායම වන මන්දි හමුදාවට එරෙහිව එක්සත් ජනපද නායකත්වයෙන් යුත් මිලිටරි ප්‍රහාරයක් අනුමත කරන ලෙස අල්-මලිකිට බුෂ් පාලනාධිකාරය බල කරමින් සිටී.

එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමට එරෙහි ෂියා ජනතා විරුද්ධත්වයේ මධ්‍යස්ථානයක් වන බැග්ඩෑඩයේ නැගෙනහිර පිහිටි විශාල කම්කරු පන්තික බහුතරයක් සහිත උප නගර ප්‍රදේශවල (සදාර් නගරය) ජනයාට එරෙහි ප්‍රචන්ඩ ප්‍රහාර උත්සන්න කිරීමේ සැලසුම් ඉදිරියට ගෙන යන ගමන් ම, මලිකිට, හුසේන්ගේ පාලනය යටතේ වඩාත්ම වධ හිංසනයන්ට ලක් වූ ෂියා බහුතරය අතර සිය විශ්වාසනීයත්වය පිලිසකර කර ගැනීමේ අවස්ථාවක් හුසේන් මරන දඬුවමට ලක් කිරීමෙන් ලැබී ඇත.

සැලකිල්ලට ගත් තවත් වැදගත් දේශපාලන සාධකයක් වේ. එය නම්, හුසේන්ට මරන දඬුවම පැමිනවීම මගින් අනුප්‍රාප්තික එක්සත් ජනපද ආන්ඩු සම්බන්ධ වී ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කල අපරාධ සම්බන්ධයෙන් මොනම සවිස්තරාත්මක විභාගයකට ඉඩ නොතබා ම හිටපු ඉරාක නායකයාට එරෙහි නෛතික සාක්ෂය විභාගය නතර කිරීම යි. 1982 දී දුජේල්හි ෂියා මිනිසුන් 148ක් ඝාතනය කිරීමේ සිද්ධිය මුලින් ම නඩු විභාගයට ලක් කිරීමට තෝරා ගැනුනේ එයට ගොදුරු වූවන් මලිකිගේ හා එක්සත් ජනපද පිටුබලය ලැබූ හිටපු අගමැති ඊබ්‍රාහිම් ජෆාරිගේ පක්ෂය වන ඩවා පක්ෂයට සම්බන්ධිත නිසා සහ එම සිද්ධියට එක්සත් ජනපදය ඍජු ලෙස සම්බන්ධ නැති නිසා ය.

සදාම් හුසේන්ගේ පාලන කාලයට අයත් වඩා ලේවැකි සෙසු සිද්ධීන්ගෙන් බොහොමයක් සම්බන්ධයෙන් තත්වය එසේ නොවේ. 1987-88 සමයේ දී, ඉරාන-ඉරාක යුද්ධයේ අවසානයට ඉස්මත්තේ දී, කුර්දි ජනයා සමූල ඝාතනය කිරීම පිලිබඳ අන්ෆාල් ව්‍යාපාරය නමින් හැඳින්වෙන සිද්ධිය පිලිබඳ වන දෙවන නඩු විභාගය යලි ඇරඹීමට නියමිතව තිබුනේ ජනවාරි 8 දා ය. හලබ්ජාහි දී කුර්දිවරුවන්ට ගෑස් ප්‍රහාර එල්ල කිරීමෙන් කූඨප්‍රාප්තියට පත් වූ මෙම කෲර ක්‍රියාවන් පිලිබඳ මොන යම් හෝ බැරෑරුම් පරීක්ෂනයක් එලිදරව් කල හැකිව තිබුනේ අනුප්‍රාප්තික එක්සත් ජනපද ආන්ඩුවල ක්‍රියාකලාපය යි.

හුසේන් 1980 සැප්තැම්බරයේ දී ඉරානයට එරෙහි යුද්ධය දියත් කලේ, ඒ වන විට ශිෂ්‍යයන් ටෙහෙරානයේ එක්සත් ජනපද තානාපති කාර්යාලය අල්ලා ගෙන එහි නිලධාරීන් ප්‍රාන ඇපකරුවන් ලෙස රඳවා ගැනීම අරබයා ඉරානය සමග ගැටුමක හිර වී සිටි කාටර් පාලනාධිකාරයේ පිටුබලය සහිතව ය. ඉන් අනතුරුව, රේගන් පාලනාධිකාරය, ඉරාන හමුදාවන් රසායනික අවි ප්‍රහාර සඳහා ඉලක්ක කර ගැනීමට උපායාත්මක මිලිටරි ඔත්තු සැපයීමත් බ්‍රිතාන්‍යය, ප්‍රන්සය හා ජර්මනිය වැනි එක්සත් ජනපදයේ යුරෝපීය සගයන්ට ඉරාකයට අවි විකිනීමට පිටුබලය සැපයීමත් මගින් අට වසරක යුද්ධය පුරා ම හුසේන්ට සැලකිය යුතු සහයෝගයක් දුන්නේ ය. මානව අයිතීන් උල්ලංඝනය පිලිබඳව විටින් විට කෙරෙන හඬ තැලීම් තිබිය දී ම එක්සත් ජනපදය යුද්ධයේ දී බැග්ඩෑඩ් ආන්ඩුවට සිය පක්ෂපාතිත්වය පවත්වා ගෙන යන බව හුසේන්ට යලි තහවුරු කරනු පිනිස, අවස්ථා දෙකක දී, එනම් 1983 සහ 1984 දී, ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් එක්සත් ජනපදයේ විශේෂ නියෝජිතයකු ලෙස ඉරාකයට එවන ලදි.

හුසේන්ට එරෙහි අනෙක් ප්‍රධාන නඩුව වන 1991 දී කුර්දිවරුන්ගේ හා ෂියාවරුන්ගේ කැරලි ලේවැකි මර්දනයට ලක් කිරීම පිලිබඳ සිද්ධිය, බුෂ් පාලනාධිකාරයට ඊටත් වඩා ගැටලු ඇති කිරීමේ තර්ජනය මතු කලේ ය. ඒ මක් නිසා ද යත්, බුෂ්ගේ ම පියා වන පලමු ජනාධිපති බුෂ්, පර්සියානු ගල්ෆ් යුද්ධය අවසානයේ දී පලමුව එම නැගිටීම් දිරි ගැන්වූ නමුදු, පසුව, ඉරාක රාජ්‍යය බිඳ වැටීමකට වඩා හුසේන්ගේ ආඥාදායකත්වය දිගට ම පැවතීම තමන්ට වාසි සහගත වනු ඇතැයි යන ලේ වැකි තීන්දුව කරා පැමිනි බැවිනි. ඉරාක රාජ්‍යය බිඳ වැටීමක් එක්සත් ජනපද යුද සැලසුම්කරුවන්ගේ ප්‍රධාන උත්සුකතාව වූ ඉරානයට වාසි ගෙන දෙනු ඇතැයි ගනන් බැලුනි.

සදාම් හුසේන්ට එරෙහි බොරු නඩු විභාගයට විරුද්ධ වීමත් ඔහුගේ මරන දඬුවම හෙලා දැකීමත් මෙම හිටපු පාලකයාට හා ඔහුගේ පිලිවෙත්වලට දේශපාලන සහයෝගය දීමක් කිසිසේත් ම ඇඟවුම් නොකරයි. හුසේන් පසුගාමී හා පීඩිත රටක ජාතික ධනේශ්වරයේ නියම නියෝජිතයෙක් විය. එනම් ඔහු විටින් විට අධිරාජ්‍යවාදය සමග ගැටුම්වලට එලඹුනු නමුත් ඉරාක කම්කරු පන්තියට එරෙහිව ඉරාක ධනේශ්වරයේ වරප්‍රසාද හා දේපොල ආරක්ෂා කිරීමට ක්ෂමා විරහිතව කැප විය.

මහජන මර්දනය පිලිබඳ හුසේන්ගේ ප්‍රථම ප්‍රධාන ක්‍රියාව වාර්තා වන්නේ 1970 ගනන් අග ඔහු බලයට නැගී ගැනීමේ කුඨප්‍රාප්තියේ දී ය. එනම් බාත් පක්ෂය ඉරාක කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය සමූල ඝාතනය කොට බැග්ඩෑඩ් නගරයේ හා තෙල් බිම්වල කේන්ද්‍රගතව තිබූ විශාල හා සටන්කාමී කම්කරු පන්ති ව්‍යාපාරය මර්දනය කිරීම යි. ආගමික/නිකායික රේඛා ඔස්සේ ඉරාකයේ වත්මන් බිඳ විසුරු වීම, එවකට එක්සත් ජනපදයේ අනුමැතිය යටතේ මෙලෙස සිදු කෙරුනු කම්කරු පන්තිය රුදුරු ලෙස මර්දනය කිරීමේ දිගු කාලින ප්‍රතිවිපාකවලින් එකකි.

කෙසේ වෙතත්, ඉරාක නායකයාට එරෙහිව නඩු අසා ඔහුට දඬුවම් නියම කලේ කම්කරු පන්තියේ අධිකරනයක් යටතේ නොවේ. ඔහු, එක්සත් ජනපදය ඉරාකය ආක්‍රමනය කොට අල්ලා ගැනීමෙන් පසුව වාඩිලා ගැනීමේ තන්ත්‍රයක් මගින් පිහිටුවන ලද කැලෑ උසාවියක ගොදුරක් විය. වෙනත් වචනවලින් කිය තොත්, ඔහුගේ අපරාධ සම්බන්ධයෙන් නඩු අසා දඬුවම් පනවනු ලැබුවේ, ඔහුගේ අපරාධවලට වඩා දරුනු අපරාධ සම්බන්ධයෙන් වැරදිකරුවන් වන අය විසිනි.

*වොෂිංටන් පෝස්ට්* සිකුරාදා කලාපයේ පල වූ කතුවැකියකින් බුෂ් පාලනාධිකාරය, ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් කොංග්‍රස් සභිකයන් සහ ඇමරිකානු මාධ්‍ය සදාම් හුසේන්ට එරෙහි නඩුව සම්බන්ධයෙන් දරන කුහක ආකල්පය හරියට ම පිලිඹිබු විය. *වොෂිංටන් පෝස්ට්* මරන දඬුවම සම්බන්ධයෙන් පවත්නා සිය පොදු විරුද්ධත්වය ගාම්භීර ලෙස ප්‍රකාශයට පත් කලේ ය. ඉන් පසුව ප්‍රකාශ කර සිටියේ, එය ඕනෑම අයෙකුට සුදුසු නම් "බොහෝ විට කිම් ජොං ඉල් හැරුනු විට ජීවත්ව සිටින අන් කවරකුටත් වඩා සිය දෑත්වල ලේ තවරා ගත් මිනිසෙකු වන සදාම් හුසේන්ට" ද යෙදිය යුතු බව යි.

අපි මෙයට එකඟ නොවෙමු. ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් මේ වන විටත් සදාම් හුසේන්ට වඩා ඉරාක වැසියන් සංඛ්‍යාවක් මරනයට පත් කොට ඇත -- එනම්, මහජන සෞඛ්‍ය පිලිබඳ ජෝන් හොප්කින්ස් විද්‍යාලය විසින් කරන ලද අධ්‍යයනයකට අනුව, 2003 මාර්තුවේ එක්සත් ජනපද ආක්‍රමනයේ පටන් මේ වන තෙක් සිදු කර ඇති ඉරාක මරන සංඛ්‍යාව 655,000කි. බුෂ්ගේ පාලන කාලයෙන් තව වසර දෙකක් ඉතිරිව තිබේ. ඉරාන-ඉරාක යුද්ධයේ දී හුසේන්ගේ එක්සත් ජනපද සගයන් වූ තවමත් ජීවතුන් අතර සිටින්නන් ද අනුප්‍රාප්තික එක්සත් ජනපද ජනාධිපතිවරුන් වූ බුෂ්ගේ පියා. ක්ලින්ටන්, බුෂ් ද සම්බන්ධයෙන් කිව යුතු නැත. ඔවුහු 1991 සිට 2003 දක්වා ඉරාක වැසියන් මිලියන 1.5කගේ මරනයට හේතු වූයේ යැයි තක්සේරු කර ඇති ඉරාකයට එරෙහි එක්සත් ජනපද නායකත්වයෙන් යුත් සම්බාධකවලට පිටුබලය දුන්හ.

ඉරාකයේ වධ බන්ධනයට හා පීඩනයට ලක් වූ ජනතාව වෙනුවෙන් මෙන් ම, එක්සත් ජනපද නායකත්වයෙන් යුත් යුද්ධයේ ගොදුරු බවට පත් වූ ඇමරිකානු, බ්‍රිතාන්‍ය හා සෙසු ජනයා සම්බන්ධයෙන් ද සැබෑ යුක්තිය ඉටු වනු ඇත්තේ, ආක්‍රමනය හා මිලිටරි වාඩිලෑම සම්බන්ධයෙන් වගකිව යුතු අය -- බුෂ්, චෙනි සහ ඔවුන්ගේ අතවැසියන් -- නීති විරෝධී ආක්‍රමනික යුද්ධයක් ගෙන යාම පිලිබඳව නඩු විභාගයන්ට ලක් කෙරුනු විට ම පමනි.